# ඇමතුම
# அமதும
# AMATHUMA

Sri Lanka Telecom

Monthly Journal of the Sri Lanka Telecom Employees - December 2006

www.slt.lk



## The Live Wire of Sri Lanka's Higher Education

Connecting our universities to a world of opportunity

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නව ප්‍රධාන විධායක නිලධාරීතුමා වැඩ භාර ගනියි

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් ශෝජි තකහෂි මහතා 2006 දෙසැම්බර් 4 වන දින වැඩ කටයුතු ආරම්භ කෙරිය. 1997 වසරේදී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම උපාය මාර්ගික හවුල්කරුවකු වශයෙන් NTT සමාගම හා එක්වීමෙන් පසුව සිව්වන ප්‍රධාන විධායක නිලධාරීවරයා වන්නේ තකහෂි මහතායි. ඒ මහතා මීට ප්‍රථම NTT Com Asia Ltd, HKNet Co.Ltd සහ NTT Com Asia Network Systems (Guang Zhou) Ltd යන සමාගම්හි සභාපතීත්වය හා ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන ලද අතර එම තනතුරු වලින් ඉවත්වී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්විය. නිහොන් විශ්වවිද්‍යාලයේ කාර්මික ඉංජිනේරු උපාධිධරයෙක් වන ඒ මහතා ජපානයේ ඵලදායිතා මධ්‍යස්ථානයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර වෙනුවෙන් වූ විශේෂ කළමනාකරණ අධ්‍යාපනය ලබාගන්නා ලදී. NTT සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලයන් කිහිපයක් හොබවා ඇති ඒ මහතා සන්නිවේදන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වසර 27ක අත්දැකීම්වලින් පරිපූර්ණ අයෙකි. 1979දී NTT සමාගම හා බැඳුණු තකහෂි මහතා සමාගම වෙනුවෙන් කැපවී වැඩ කළ අයෙකි. NTT Com Asia Ltd සහ Hong Kong Ltdහි විධායක උප සභාපති මෙන්ම NTT Communicatiosහි ආක්ස්ටාර් කොට්ඨාශයේ සහ ජාත්‍යන්තර ව්‍යාපාර කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන්ද කටයුතු කෙරීය.



# புதிய பிரதம நிறைவேற்று அதிகாரி பதவி ஏற்றார்

ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனியின் புதிய பிரதம நிறைவேற்று அதிகாரியாக திரு. ஷோஜி தகஹஷி சென்ற நான்காம் திகதி கடமைகளைப் பொறுப்பேற்றார். 1997 இல் ஜப்பான் NTT கம்பனியுடன் இலங்கை அரசு ஏற்படுத்திக்கொண்ட மூலோபாய பங்குதாரரான பின் ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனிக்கு நியமிக்கப்பட்ட நான்காவது பிரதம நிறைவேற்று அதிகாரி திரு. தகஹஷி ஆவார். அவர் இதற்கு முன் Com Asia Ltd, HKNet Co. Ltd மற்றும் NTT Com Asia Network Systems (Guang Zhou) Ltd ஆகிய கம்பனிகளுக்கு தலைமை வகித்துள்ளார். ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனியின் பிரதம நிறைவேற்று அதிகாரியாக பதவியேற்கு முகமாக திரு. தகஹஷி இம் மூன்று பதவிகளையும் ராஜினாமாச் செய்துகொண்டார். நிஹோன் பல்கலைக் கழக பொறிமுறை எந்திரவியல் பட்டதாரியாகிய அவர் ஜப்பான் உற்பத்திமையத்தின் சர்வதேச வாணிபத்தில் விசேட முகாமைத்துவ கல்வித் தகைமை பெற்றவராவர். திரு. தகஹஷி தொலைச் செய்திப் போக்குவரத்துத் துறையில் 27 ஆண்டுகளுக்கு மேல். அனுபவத்தைக் கொண்டுள்ளதுடன் NTT கம்பனியில் சிரேஷ்ட முகாமைத்துவ பதவிகள் பலவற்றிலும் பணியாற்றியுள்ளார். மேலும், அவர் 1979 இல் NTT கம்பனியில் இணைந்து கொண்டதிலிருந்து அங்கு தமது பொறுப்புக்களில் சிறப்பாகப் பணிபுரிந்து உயர் நிலையை அடைந்தவராவர். NTT Com Asia Ltd மற்றும் NTT Honkong Ltd ஆகியவற்றின் நிறைவெற்று உப தலைவராகவும், NTT தொலைச் செய்திப் போக்குவரத்துத்துறைசார் பணிப்பாளராகவும் சேவைசெய்துள்ளார்.

# New CEO Assumes Duties

Shoji Takahashi assumed duties as the Chief Executive Officer of Sri Lanka Telecom on December 4, 2006. Takahashi becomes the fourth CEO of SLT since its strategic partnership forged with NTT of Japan in 1997. He is a former President and CEO of NTT Com Asia Limited, HKNet Co. Ltd, and NTT Com Asia Network Systems (Guangzhou) and left these positions to take up the position as CEO of SLT. He is a Bachelor's Degree holder in Mechanical Engineering from Nihon University in Japan and a Master's degree holder in International Business Management from the Japan Productivity Centre and counts over 27 years of experience in the field of telecommunications. He has held a number of senior management positions within NTT. From his start at NTT in 1979, he has swiftly risen in his responsibilities within the company. He has also formerly held the positions of Executive Vice President of NTT Com Asia Limited and NTT Hong Kong Limited and Director at the Arcstar Division and the Overseas Carrier Business Division of NTT Communications.




# දිරාගු-ශ්‍රී ලංකා ටෙලිකොම් සමුද්‍රස්ථ කේබල් පද්ධතිය ආරම්භ කරයි

ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර සමුද්‍රස්ථ කේබල් පද්ධතිය විවෘත කිරීම පසුගියදා සිදු කෙරිණි. මේ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ මාලදිවයිනේ දිරාගු සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 20ක ආයෝජනයක් සිදු කර ඇත.

කොළඹ හා මාලේ යන ප්‍රධාන නගර අතර දිවෙන මෙම කේබල් පද්ධතිය කිලෝමීටර් 850ක් දිගු වන අතර තත්පරයට ගිගාබයිට්ස් 10ක ධාරිතාවයෙන් යුතුය. මෙම සංදාමය විවෘත කරමින් සභාපති තුමා, මාලදිවයිනට ගොස් සිටි ශුගෙයි අනන් මහතා සමඟ සජීවී සංවාදයක් පැවැත්විය.

මෙමගින් දිරාගු සමාගම ලෝකයේ අනෙකුත් රටවල් හා සම්බන්ධවීමක් සිදු වන අතර ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර අධිවේගී තොරතුරු සන්නිවේදනයට අවස්ථාව සැලසෙයි. එමෙන්ම මෙම කේබල් පද්ධතිය මගින් උසස් සන්නිවේදන සේවාවක් හරහා

# மாலைதீவுக்கும் இலங்கைக்குமிடையே திராகு-ஸ்ரீலரெ கடலடிக் கேபிள் முறைமை

இலங்கைக்கும் மாலைதீவுக்குமிடையே திராகு ஸ்ரீலரெ கடலடிக் கேபிள் முறைமை அங்குரார்ப்பணம் செய்து வைக்கப்பட்டுள்ளது பற்றி ஸ்ரீலரெ நிறுவனம் சமீபத்தில் அறிவித்துள்ளது. ஸ்ரீலரெலிகொம் நிறுவனமும் மாலைதீவு திராகு நிறுவனமும் இணைந்து 20 மில்லியன் அமெரிக்க டொலர் முதலீட்டுடன் ஆரம்பித்துள்ள இக் கேபிள் முறைமை தெற்காசியாவில் அதிசிறந்த தொலைத்தொடர்பு வசதிகளை ஏற்படுத்துவதன் மூலம் பொருளாதார வளர்ச்சியை மேம்படுத்தும் நோக்கம் கொண்டதாகும்.

850 கிலோ மீட்டர் நீளம்கொண்ட இக் கேபிள் ஒரு செக்கனுக்கு 10 ஜிகாபிட்ஸ் வேகம் கொண்டதாகும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දකුණු ආසියාවේ ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීම අරමුණු කොට ඇති අතර ව්‍යාපෘතිය මගින් සමස්ත ආසියානු කලාපයේම වෙළඳ හා වාණිජ සබඳතාද උසස් මට්ටමකට දියුණු වනු ඇති බවට බලාපොරොත්තු වේ. තවද දකුණු ආසියානු කලාපයේ විදුලි සංදේශ හා සන්නිවේදන කටයුතු නව මාවතකට යොමු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කළ හැකි බවටද අපේක්ෂා කෙරේ.

නව තාක්ෂණය යොදා ගනිමින් ක්‍රියාත්මක කරවන මෙම සබ්මැරීන කේබල් පද්ධතිය ඉදිකිරීම හා පරිපාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සහ දිරාගු සමාගම් විසිනි.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ෂොජි තකහෂි මහතා පවසා සිටියේ, "ලෝකයේ බොහෝ රටවල් සමඟ සමුද්‍රස්ථ කේබල් සබඳතා පැවැත්වීමට අවශ්‍ය සියලුම තාක්ෂණික උපාංග අප සතුයි. ශ්‍රී ලංකාව හරහා ලෝකයේ අනිකුත් රටවල්වලටද සම්බන්ධවීමට දිරාගු සමාගමට මෙමගින් හැකියාව ලැබී තිබෙනවා. අප සතු SEA-ME-WE 4, SEA-ME-WE 3 සහ භාරත්-ලංකා කේබල් පද්ධතිවල ධාරිතාවන් මාලදිවයිනට සැපයීමට හැකි වන අතරම එමගින් මෙම පද්ධතිය ලෝකයේ අනිකුත් රටවල් හා බද්ධ කිරීමටත්, එමෙන්ම භාරත්-ලංකා කේබල් පද්ධතිය හරහා එම සම්බන්ධතාවය ඉන්දියාවටත් ලබාදිය හැකි වෙනවා." යන්නයි.

ඉන්දියාවේ සීමාසහිත භාරත් සංචාර් නිගම් සමාගම සමග එක්ව ආරම්භ කළ භාරත්-ලංකා සමුද්‍රස්ථ සබ්මැරීන් කේබල් පද්ධතියට පසුව ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ දෙවන පාර්ශ්වික කලාපීය සන්නිවේදන සහකරු වන්නේ මාලදිවයිනේ දිරාගු සමාගමයි.

இந்த முறைமையை ஆரம்பித்துவைத்த தலைவர், மாலைதீவுக்குச் சென்றுள்ள சுஹெய் அனன் அவர்களுடன் நேரடியாக உரையாடினார். இதன் மூலம் திராகு நிறுவனத்துக்கு இலங்கை ஊடாக உலகம் முழுவதும் இணைப்பை ஏற்படுத்திக் கொள்ளும் வசதி கிடைப்பதுடன் இலங்கைக்கும் மாலை தீவுக்குமிடையே அதிவெக மட்டத்திலான அதியுயர் அலைவரிசைக்கு இடமளிக்கும்.

ஸ்ரீலரெலிகொம் நிறுவன பிரதம நிறைவேற்று அதிகாரி திரு. ஷோஜி தக்கஹஷி இது பற்றிப் பேசுகையில் "உலகத்தில் உள்ள சகல பிரதான நகரங்களுடன் இலங்கையை இணைக்கக்கூடிய கலடிக் கேபிள்கள் ஏற்கனவே எம் வசம் உள்ளன. எனவே இலங்கை ஊடாக திராகுவும் சர்வதேச ரீதியான இணைப்பைப் பெறும் வசதியை கொண்டிருக்கும். ஸ்ரீலரெலிகொம் தற்போதுள்ள SEA-ME-WE 4, SEA-ME-WE 3 கொள்ளளவையும் மற்றும் பாரத் லங்கா கேபிள் முறைமையினையும் மாலைதீவுக்கு விற்பனை செய்யலாம்.

இந்த சாதகமான நிலையைப் பயன்படுத்தி மாலைதீவு இத் தொடர்புகளை உலகின் எஞ்சிய பகுதிகளுக்கு இணைத்துக்கொள்ளவும், பாரத்-லங்கா கடலடிக் கேபிள் முறைமை ஊடாக இந்தியாவுக்கு இணைப்பை ஏற்படத்தவும் வசதியாகவிருக்கும்" என்று கூறினார்.

## Dhiraagu - SLT Optical Fibre Submarine Cable System Inaugurated

SLT recently announced the inauguration of the Dhiraagu - SLT optical fibre submarine cable system between Sri Lanka and the Maldives. At an investment of US$20mn by SLT and Dhiraagu of Maldives, the cable system aims to enhance economic growth via superior telecommunications in South Asia.

The cable will span 850 kilometres at a capacity of 10 gigabits per second. It will enable Dhiraagu to be connected with the rest of the world, through Sri Lanka, and will allow for superhighway level bandwidth between Sri Lanka and the Maldives. P Asoka de Silva Weerasinghe, Chairman of SLT inaugurated the system by having a live discussion via the fibre optic cable with Former CEO SLT Shuhei Anan, who was in Maldives.

On the occasion Shoji Takahashi CEO SLT stated, "We already have existing submarine cable links connecting Sri Lanka to all the major countries of the world. Dhiraagu will have worldwide connectivity via Sri Lanka. While SLT can sell the capacity of the existing SEA-ME-WE 4, SEA-ME-WE 3 and Bharat-Lanka cable systems to the Maldives, the Maldives in turn can take advantage of these links to be connected to the rest of world as well as being connected to India via the Bharat-Lanka cable system."

## හිටපු ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් මා කටයුතු ආරම්භ කළ 2001 ජූලි මස සිට මට සහයෝගය දැක්වූ ඔබ සැමට මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

ඇත්තවශයෙන්ම මා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමගින් බැඳුණේ NTT සමාගම විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 225ක් වැය කරමින් ශ්‍රී ලංකා රජය වෙතින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ 35%ක කොටස් මිලදී ගැනීමත් සමඟමය. මගේ පළමු ශ්‍රී ලංකා සංචාරය සිදුවූයේ 1985දීය. එ NTT සමාගම යටතේ ඇති ශ්‍රී ලංකාවේ Alumni Association වෙතය.

1996දී තායි දුරකථන සහ විදුලිසංදේශ සමාගම සංවර්ධනය කළ පසු NTT සමාගම විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම පිළිබඳව අධ්‍යයනයක යෙදීම සඳහා මා යොමු කරවීය. එතැන් පටන් ශ්‍රී ලංකා ටෙලිකොම්හි සංවර්ධනය උදෙසා මම මගේ උපරිම සහයෝගය ලබාදුනිමි. එහිදී මා හඳුනාගත් පරිදි සමාගම තුළ වෙනස් කළ යුතු අංශ රැසක් විය. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සංවර්ධනය කිරීම සඳහා මම ජපානයේ සිට සාමාජිකයන් රැසක් මෙරටට එවීමට කටයුතු කළෙමි. කෙසේවුවද අවසානයේදී මම ශ්‍රී ලංකාවේ විශාලතම සමාගම්වලින් එකක් වන ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් පත් වුනෙමි. මෙම සමාගම සංවර්ධනය කිරීමේදී මම ඔබත් සමඟ විවිධ දුෂ්කරතාවලට මුහුණ දුන්නෙමි. පරිවර්තන තුළින් අත්වූ පැහැදිලි වෙනසක් දැන් ඔබට දැකිය හැකි වනු ඇත. සමාගම තුළ සිදු වූ පරිවර්තන මෙන්ම සමාගම අත්පත් කරගත් දියුණුවද බොහෝ දෙනෙක්ගේ අවධානයට යොමු විය.

1997දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ පිරිවැටුම ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් විය. 2006දී එය ඇමෙරිකානු ඩොලර් මිලියන 400 දක්වා ඉහළ නැංවිණි. මේ වනාහි සමාගම් ඉතිහාසය තුළ පෞද්ගලීකරණයෙන් පසු ඔබ විසින් අත් කරගත් විශාල ජයග්‍රහණයකි. නුදුරු [illegible] ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ තවදුරටත්

**AMATHUMA**

**Monthly Journal of Sri Lanka Telecom Employees**

**December 2006**

**Published By:**
Corporate Relations Section,
Sri Lanka Telecom,
Level 1, CTO Building,
Lotus Road, Colombo 01.
Tel: 2446741 Fax: 2441371
Email: amathuma@slt.com.lk

**Co-ordinated By:**
Jagath Dheerasekara
Vajira Hapuhinna

**Photography:**
Sisira Gintotage

**Produced By:**
BT Options

**www.slt.lk**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංවර්ධනයක් දැකිය හැකි අතර ශ්‍රී ලංකාව තුළ ඔබ සමාගමේ තත්ත්වය තවදුරටත් ඉහළ නැංවෙනු ඇත.
මම මාගේ උපරිම හැකියාවන් සහ ශක්තිය ශ්‍රී ලංකාවේ මෙම දැවැන්ත සමාගම සංවර්ධනය උදෙසා යෙදවුවෙමි. මම මෙහි පැමිණීමට පෙර මා සතු වූ අත්දැකීම් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සංවර්ධයෙහිලා බෙහෙවින්ම ඉවල්විය.
පසුගිය පස් වසර පුරා මා වෙත සහයෝගය දක්වමින් මා සමඟ කටයුතු කිරීමට ඔබ දැක්වූ උනන්දුව පිළිබඳව මා නැවත වරක් ඔබට ස්තුතිවන්ත වෙමි. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම කණ්ඩායම් හැඟීමෙන් යුතු පාරිභෝගික තෘප්තිය සපයන්නා වූ සමාගමක් ලෙස සදාකල්හි මතකයේ රැදෙනු ඇත. මට මෙන්ම නව ප්‍රධාන විධායක නිලධාරීවරයාටද ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම තවදුරටත් සංවර්ධනය කිරීම උදෙසා ඔබගේ සහයෝගය ලබාදෙනු ඇතැයි මම අපේක්ෂා කරමි.

ස්තුතියි
ෂුගෙයි අනන්

## Former CEO's Message

First of all, I would like to say thank you to all my staff who served under me at SLT since I became CEO in 2001. I was initially involved in the activities of SLT when NTT bought a 35% stake from the government of Sri Lanka, spending US$ 225mn. My first visit to Sri Lanka was in 1985 to participate in the Alumni Association, which was organised with the co-operation of NTT Japan. Since 1985, there was an ongoing indication that I would have to work in SLT.



After I developed the Thai Telephone & Telecommunications Company in 1996, I was assigned to study the investment of SLT by NTT. Since, then I have tried to do my best to develop this company to an optimum level. There were so many areas in which SLT had to change. I sent for many members of staff from Japan to develop SLT. I got the appointment to become CEO of SLT and to manage one of the biggest companies in Sri Lanka in July of 2001. Having faced many challenges with you to develop the company, everyone can now see the fruits of our labour.

Everyone noticed the changes that took place in SLT and recognised the spiraling growth of the Company. Those changes were made totally with your strong co-operation, contribution and devotion to the enhancement of SLT.

In 1997, turnover was around US$100mn and in the year 2006 it might rise to US$400mn. Our achievements post privatisation have been of an historic magnitude and you will also in the future see such advances in the progress of SLT.

I used all of my capacity and capability to develop this, the biggest company in Sri Lanka. My experience before I came here was a strong driving force, that helped me to pave the way to do so.

I would like to thank you once again for your co-operation and the enthusiasm you displayed

## பிரதம நிறைவேற்று அதிகாரியின் பிரியாவிடைச் செய்தி

ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனியின் பிரதம நிறைவேற்று அதிகாரியாக நான் 2001 இல் பதவியேற்றபின் எனக்குக் கிழ் சேவையாற்றிவந்துள்ள அனைத்து ஊழியர்களுக்கும் எமது நன்றியை முதற்கண் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். 225 மில்லியன் அமெரிக்க டொலருக்கு NTT கம்பனி இலங்கை அரசாங்கத்திடமிருந்து 35% பங்கினை கொள்வனவு செய்தபோதே நான் ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனியின் செயற்பாடுகளில் ஈடுபடத் தொடங்கினேன். ஜப்பான் NTTயின் ஒத்துழைப்புடன் ஒழுங்குசெய்யப்பட்ட பழைய மாணவர் சங்க கூட்டத்தில் பங்குபற்றுவதற்காக முதன் முதலில் 1985 இல் இலங்கை வந்திருந்தேன். அன்று தொடக்கம் நான் ஸ்ரீலரெலிகொம் நிறுவனத்தில் பணிபுரிய வேண்டிவரும் என்ற அபிப்பிராயம் நிலவியது.
1996 இல் தாய் தொலைபேசி மற்றும் தொலைத்தொடர்புக் கம்பனியை நான் வளர்த்தெடுத்தபின். NTT ஸ்ரீலரெலிகொம் கம்பனியில் முதலீடு செய்வது பற்றி ஆய்வொன்றை நடத்துமாறு என்னிடம் கேட்கப்பட்டது. அன்றுதொட்டு இக்கம்பனியை அனுகூல மட்டத்திற்கு அபிவிருத்தி செய்வதற்கு என்னாலான முயற்சிகளை மேற்கொண்டேன். ஸ்ரீலரெலிகொம் கம்பனியின் பல அம்சங்களில் மாற்றங்கள் செய்யப்படவேண்டியிருந்தன. இக் கம்பனியை விருத்தி செய்வதற்காக நான் ஜப்பானிலிருந்து பல உத்தியோகத்தர்களை வரவழைத்தேன். இதன் பிரதம நிறைவேற்று அதிகாரியாக நான் 2001. யூலாய் மாதத்தில் நியமனம் பெற்றதன் மூலம் இலங்கையின் மிகப் பெரும் கம்பனிகளுள் ஒன்றை நிர்வகிக்கும் பொறுப்பை ஏற்றுக்கொண்டேன். இக் கம்பனியை விருத்தி செய்வதில் உங்களின் உதவியுடன் பல்வேறு சவால்களை சமாளிக்க வேண்டி ஏற்பட்டது. ஆயினும், எமது முயற்சியின் பெறுபேறுகளை நீங்கள் இப்பொழுது கண்ணூடாக காணலாம். ஸ்ரீலரெலிகொம் கம்பனியில் ஏற்பட்ட மாற்றங்களை ஒவ்வொருவரும் அவதானித்திருப்பதுடன் கம்பனியின் பெரு வளர்ச்சியை அங்கீகரித்துமுள்ளனர். இத்தகைய மாற்றங்களுக்கு உங்களின் உறுதியான ஒத்துழைப்பும் அர்ப்பணிப்புமே காரணங்களாகவிருந்தன.

1997 இல் புரள்வு 100 மில்லியன் அமெரிக்க டொலர்களாகக் காணப்பட்டது. 2006 இல் அது 400 மில்லியன் அமெரிக்க டொலர்களாக அதிகரிக்கலாம். தனியார் மயப்படுத்தப்பட்ட பின் நாம் கண்ட சாதனைகள் மகத்தானவை. ஸ்ரீலரெலிகொம் கம்பனியின் வளர்ச்சியில் அத்தகைய முன்னேற்றங்களை எதிர்காலத்திலும் நீங்கள் அவதானிக்க முடியும். இப்பெரும் கம்பனியை அபிவிருத்தி செய்வதில் நான் என்னுடைய முழு ஆற்றலையும், சக்தியையும் பிரயோகப்படுத்தியுள்ளேன். இப்பணியை முன்னெடுப்பதில் நான் ஏற்கனவே பெற்றிருந்த அனுபவம் எனக்கு பெருமளவில் உதவியது.

கடந்த ஐந்தாண்டு காலத்தில் என்னுடன் கடமையாற்றியபொழுது நீங்கள் காட்டிய உற்காசமும் வழங்கிவந்த ஒத்துழைப்பும் குறித்து எனது நன்றியை மீண்டும் தெரிவித்துக்கொள்கிறேன்.
வாடிக்கையாளர்களுக்கு திருப்தியளிக்கும் இறுதி இலக்கு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

when working with me over the last five years. SLT's values will always remain based on team work and the co-operation of others with the final goal of customer satisfaction.

I do hope that you would support the new CEO the same as you did me, all for the mutual benefit and development of SLT.

Thank You,
Shuhei Anan

நோக்கிச் செல்வதற்கு ஏனையோரின் ஒத்துழைப்புடன் ஒன்றிணைந்து கூட்டாக செயற்படுவதன் மூலமே ஸ்ரீலரெலிகொம் கம்பனியின் பெறுமானங்களை என்றென்றும் தக்கவைக்க முடியும்.

இக் கம்பனியின் அபிவிருத்தியையும் பரஸ்பர நலனையும் கருத்திற்கொண்டு எனக்கு அளித்த அதே ஆதரவை புதிய நிறைவேற்று அதிகாரிக்கும் நீங்கள் வழங்குவீர்கள் என்று நம்புகின்றேன்.

**நன்றி**
**சுஹெய் அனன்**

## දේශීය විශ්වවිද්‍යාල එකම ජාලයකට




ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් ලංකා අධ්‍යාපනික සහ පර්යේෂණ ජාලය (LEARN-Lanka Education And Research Network) නවතම සන්නිවේදන තාක්ෂණික ක්‍රමෝපායන් මගින් ඉහළ නංවා ලීම සඳහා කටයුතු කරන ලදී.

ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට හා දිවයිනේ ඇති විශ්වවිද්‍යාල 13ක් වෙත 10 MBPS ධාරිතාවයෙන් යුත් IP/ VPN සම්බන්ධතාවය ලබාදෙයි. මෙමගින් විවිධ අන්තර්ජාලීත හැදෑරීමේ ක්‍රියාදාම, වීඩියෝ මගින් සම්මන්ත්‍රණ පැවැත්වීම, වේගවත් අන්තර්ජාල පහසුකම් ආදිය ලබාදෙන අතර ඒවා අදාළ විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනික හැකියා හා අවශ්‍යතා අනුව පසුකාලීනව වැඩිදියුණු කෙරේ. තවද මෙම ජාලය මගින් යෝජිත උසස් අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය මෙහෙයවීම සඳහාද පහසුකම් සපයයි.

ආයතනික වෙළඳපොළ සංවර්ධන කොට්ඨාශ ප්‍රධානී අජිත් සිල්වා ප්‍රකාශකර සිටියේ දැශ්‍ය තන්තු සංදාම පදනම් කර ගනිමින් සන්නිවේදන අවශ්‍යතාවන් සපුරාලීම සඳහාත් අධ්‍යාපනික සහ පරියේෂණ කටයුතු සඳහා සන්නිවේදන ජාලයේ අවශ්‍යවන ධාරිතාවයන් සපුරාලීමටත් ලර්න් (LEARN) ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම මූලාරම්භයක් ලබාගෙන ඇති බවයි.

ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරමින් ව්‍යාපාරික විසඳුම් අංශ ප්‍රධානී ජානක අබේසිංහ ලර්න් ව්‍යාපෘතිය හා සම්බන්ධ අනිකුත් ව්‍යාපෘතීන් පිලිබඳවත් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ කාර්යභාරය පිලිබඳවත් දැනුවත් කිරීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ආරියරත්න හේවගේ මහතා ප්‍රකාශ කර සිටියේ මෙමගින් සිසුන්ගේ අවශ්‍යතා සඳහා මෙම අධ්‍යාපනික ක්‍රියාදාමය යොමු වන බවත් මෙම ජාලය භාවිත කරන්නන්හට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවය ලබාදෙමින් අධ්‍යාපනික කටයුතු සඳහා මාර්ගෝපදේශකත්වයක් ලබාදෙන බවයි.

## ஒரே வலையமைப்பின் கீழ் தேசிய பல்கலைக்கழகங்கள்

இலங்கையின் கல்வி மற்றும் ஆய்வு வலையமைப்பை (LEARN) ஸ்ரீலரெ கம்பனி சமீபத்தில் தொடக்கி வைத்துள்ளது. தேசிய ஆய்வு மற்றும் கல்வி வலையமைப்பு (NREN) மேற்கொண்டுள்ள கல்வி அமைச்சின் பட்டதாரி முன்படிப்புக் கல்வியை மேம்படுத்தி, பொருத்தமானதாகவும் தரமுயர்த்துவதற்குமான திட்டத்திற்கு "லேர்ன்" என்ற இந்த வலையமைப்பு ஒத்தாசை வழங்கும் இம் முயற்சிக்கு பல்கலைக்கழக மானிய ஆணைக்குழுவும் (UGC) நேரடியாக உதவி வழங்கிவருகின்றது.

ஸ்ரீலரெலிகொம் கம்பனி பல்கலைக்கழக மானிய ஆணைக்குழுவுக்கும் நாடளாவிய ரீதியில் உள்ள 13 பல்கலைக் கழகங்கள் ஒவ்வொன்றுக்கும் 10 Mbps IP VPN தொடர்புகள் வாயிலாக இணைப்பு வசதிகளை வழங்கும். பல்வேறு மின்னியல் கற்கை நடவடிக்கைகளுக்கு இவை அனுசரணையாக இருப்பதுடன் மேம்படுத்தப்பட்ட ஒளித் தோற்ற மகாநாட்டுக்கும் மாணவர்களுக்கும் அவர்களின் பல்கலைக்கழகங்களுக்கும் முன்னேற்றகரமான இணையத்தள பெறுவழிக்கும் இடமளித்து இணைவதற்கும் கல்விசார் திறன்களை மேம்படுத்தவும் இவை வழிவகுக்கும்.

கூட்டிணைவுச் சந்தைப்படுத்தல் அபிவிருத்திப் பரிவின் முதல்வர் திரு. அஜித் சில்வா பேசுகையில் "ஸ்ரீலரெலிகொம், கல்வியல் மற்றும் ஆராய்ச்சி சம்பந்தமான எதிர்காலத் தேவைகளுக்கு அதியுயர் அளவிலான அலைவரிசையினை ஒளியிழை வலையமைப்பை ஆதாரமாகக் கொண்டு 'லேர்ன்' இன் இரண்டாம் கட்ட செயற்பாடுகளுக்கு இணைப்பு தேவைகளை வழங்கும்." எனக்கூறினார். இவ்வறிமுக நிகழ்வின்போது தீர்வுகள் விற்பனைப் பிரிவின் தலைவர் திரு. ஜானக அபேசிங்க 'லேர்ன்' செயற்றிட்டம் தொடர்பான செயற்பாட்டு விளக்கம் ஒன்றை அளித்திருந்தமை குறிப்பிடத்தக்கது.

தரமுயர்த்தப்பட்ட வலையமைப்பு உயர் கல்வி முகாமைத்துவ தகவல் முறைமையின் செயற்பாட்டிற்கும் பல்கலைக்கழகங்களிடையே விரைவான முகாமைத்துவ தரவுகள் பரிமாற்றத்திற்கும் உதவியளிக்கும் வகையில் விரைவான இணையத்தள பெறுவழியை காண்பதற்கான வளர்ந்துவரும் தேவையைப் பூர்த்தி செய்யும்" என்று கல்வி அமைச்சின் செயலாளர் ஆரியரத்ன ஹேவகே கூறினார்.

இப்புதிய 'லேர்ன்' வலையமைப்பு MPLS IP VPN தொழில்நுட்பத்தினை அடிநாதமாகக் கொண்டதாகும். ஒவ்வொரு பல்கலைக்கழகமும் ஒளியியல் இழை மூலமாக 10mbps வேகங்களில் SLTMPLக்கு இணைக்கப்பட்டுள்ளது. இந்தப் புதிய வலையமைப்பின் உள்ளக சேவையகம் ஸ்ரீலரெலிகொம் இணையத்தள தரவு மையத்தில் (iDC) அமைந்துள்ளது.

இந்நாட்டின் கல்வி வளர்ச்சிக்கான எமது கம்பனியின் அர்ப்பணிப்புச் சேவையின்பால் இது மற்றுமொரு பங்களிப்பாகும்.




Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# SLT to Connect LEARN phase 2 with High-Bandwidth Links

The second phase of the Lanka Education And Research Network (LEARN) was launched recently. LEARN is a project that comes under the Ministry of Education's Improve Relevance and Quality of Undergraduate Education (IRQUE) initiative.

LEARN phase 2 connects 13 universities and the University Grants Commission using 10 Mbps IP- VPN links. Optical Fibre based connectivity is provided at all the sites of phase 2. The initial bandwidth requirement of 10 Mbps is expected to be upgraded to 20 Mbps at several key university locations, in the near future. LEARN phase 2 strengthens the communication infrastructure for Sri Lankan universities to facilitate e-learning activities, high speed Internet access and the operation of Higher Education Management Information System (HEMIS). The project is expected to be completed by May 2007.

Former SLT CEO, Shuhei Anan stressed the SLT's commitment towards the improvement of communication infrastructure for education in the country.

Ajith Silva, Head of Division, Corporate Market Development said "SLT's initiative to power the LEARN phase 2 will provide the future bandwidth requirements for educational and research purposes in universities, as the fibre optical based access to universities is essential in catering the connectivity requirements."

Janaka Abeysinghe, Head of Section, Solution Business, presented an overview of the LEARN and the related projects handled by the Corporate Market Development division of SLT at the occasion of the launch.

The Ministry of Education awarded the LEARN phase 2 to SLT following its successful bid in a national competitive tender, with competitive bids from other service providers, including Dialog Broadband. The Corporate Market Development Division was successful in proposing a superior solution over the competitive bidders.

Speaking at the occasion Ariyaratne Hewage, Secretary, Ministry of Education said, "This enhanced LEARN network represents a breakthrough in using educational content to refine personalised student instruction. At both the user and university level, this network will respond to the growing need for faster Internet access to assist in navigating educational content."

From SLT, Shuhei Anan Former CEO, Ajith Silva Head of Division, Corporate Market Development and Janaka Abeysinghe, Head of Section, Solution Business were present at the occasion of the launch.





## රම්බොඩ-නුවරඑළිය දෘශ්‍ය තන්තු සංදාමය ප්‍රතිස්ථාපනය කෙරේ

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් දිවයිනේ කොළඹ, ගම්පහ, මීගමුව, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය, කළුතර, රත්නපුර, අවිස්සාවේල්ල සහ ගල්කිස්ස ආදී ස්ථාන 15ක් ආවරණය කරමින් කිලෝමීටර 670ක් පුරා දිවෙන දෘශ්‍ය තන්තු සංදාම පද්ධතිය ස්ථාපනය කරන ලද්දේ 1998 වසරේදීය. මේනිසා විදුලිසංදේශ ක්ෂේත්‍රයේ නව සේවාවල ප්‍රතිලාභ සිය පාරිභෝගිකයන් වෙත අත්කර දීම සඳහා සමාගමට අත්වූ පිටිවහල අතිමහත්ය.

එහෙත් පසුගිය දෙවසරක කාලයක සිට ආරම්භ කරන ලද මාර්ග සංවර්ධන කටයුතු හේතු කොට දෘශ්‍ය තන්තු සංදාමයේ ඇතැම් ස්ථානයන්ට හානි පැමිණීම සිදු විය. එම සංදාමයන්ගෙන් ආවරණය වන ප්‍රදේශවල සන්නිවේදන කටයුතු යථා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා එසේ සංදාමයේ හානියට පත්වූ ස්ථානයන් යළි යළිත් සම්බන්ධ කිරීමට මෙහිදී සමාගමට සිදු විය. තවද සංදාම හානියේ වැඩිම බලපෑම ඇති වී තිබුණේ රම්බොඩ හා නුවරඑළිය කලාපයේ සංදාමය සඳහායි. "මේ සංදාමයේ සෑහුවම භූගත කොට ස්ථාපනය කළ ස්ථානත් එමෙන්ම ගුවන් සංදාම ලෙස ස්ථාපනය කළ ස්ථානත් තිබෙනවා. මාර්ගය පුළුල් කිරීමේ කටයුතුවලදී ස්ථාපිත දෘශ්‍ය තන්තු සංදාමයට හානි පැමිණුනා. හානිය තරමක් බරපතල වූ විට අපි කළේ තාවකාලික සංදාමයක්, මාර්ගයට පිටින් සම්බන්ධ කිරීමයි. එයටද විවිධ පුද්ගලයන්ගෙන් හානි පැමිණුනා. දිනෙන් දින සංදාමයට ඇතිවන හානිවීම් වැඩිවීම නිසා රම්බොඩ සිට නුවරඑළිය දක්වා අලුත් සංදාමයක් ස්ථාපිත කිරීමට අපි අදහස් කළා." යැයි සම්ප්‍රේෂණ නඩත්තු අංශ ප්‍රධානී පාරින්ද වීරසේකර මහතා පැවසීය. හානිවීම් නිසා බොහෝ විට රම්බොඩ විනිමය හුවමාරු

## றம்பொட-நுவரெலிய இழை ஒளியியல் வடம் மீளமைப்பு

ஸ்ரீலங்கா ரெலிகொம் கம்பனி கொழும்பு, கம்பஹா, நீர்கொழும்பு, நுவரெலியா, களுத்துறை, அவிஸ்ஸாவளை, கல்கிசை போன்ற தீவின் 15 முக்கிய நகரங்களை இணைக்கும் 670 கிலோ மீட்டர் நீளமான இழை ஒளியியல் வடம் 1998 இல் தாபிக்கப்பட்டதாகும். இதன் மூலம், இக் கம்பனி தன்மீது நம்பிக்கை வைத்துள்ள வாடிக்கையாளர்களுக்குத் தொலைத் தொடர்புத்துறையின் நவீன தொழில்நுட்ப வசதிகளை கடந்த சில ஆண்டுகளுக்கு மேலாக ஏற்பாடு செய்துவந்துள்ளது.

ஆயினும், கடந்த சில ஆண்டுகளில் நடைபெற்ற வீதி அபிவிருத்திப் பணிகள் காரணமாக, இவ்வட்டத்தின் பாகங்கள் சேதமடைந்தன. அப்பிரதேசங்களில் தொடர்புத்துறைச் சேவைகளை தொடர்ந்தும் நடத்திவருவதற்காக, இக்கம்பனி தற்காலிக வழிமுறைகளைப் பயன்படுத்தி சேதமுற்ற வடங்களை மீளிணைப்பதன் மூலம் பாதிக்கப்பட்ட பாகங்களைத் தொடர்ந்து திருத்தவேண்டி ஏற்பட்டது.

றம்பொடைக்கும் நுவரெலியாவுக்கும் இடைப்பட்ட பகுதிகளிலேயே பெருமளவு சேதம் ஏற்பட்டது. "வடத்தின் பாகங்கள் நிலத்தின் அடியில் நேரடியாக புதைக்கப்பட்டதுடன், மிகுதியானவை வான்வழி வடங்கள் மூலமாக கொண்டு செல்லப்பட்டன" என்று கடத்துதல் பராமரிப்பு பிரிவின் தலைவர் பாரிந்த வீரசேகர கூறினார். அவர் மேலும் விளக்குகையில் "இச் சேதங்கள் காரணமாக நுவரெலிய கடத்துதல் பிரிவுக்கு வாராவாரம் அறிவிக்கப்பட்ட தடைகளின் எண்ணிக்கை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මධ්‍යස්ථානයට සතියකට වාර්තා වූ දෝෂ ප්‍රමාණයද ඉතා ඉහළ අගයක පැවතිණි. කේබලයක් එදිනම යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඇතැම් විට පැය 7-8ක කාලයක් ගත වෙයි.

සාමාන්‍යයෙන් සංදාම වළල්ලේ කොතැනක හෝ බිඳීමක් සිදු වුයේ නම් පැමිණෙන ඇතික් ඇමතුම් ස්වයංක්‍රීයව සාමාන්‍ය ගමන් මාර්ගය වෙනුවට වෙනත් විකල්ප සංදාම කව භාවිත කරමින් සන්නිවේදන කටයුතු සම්පූර්ණ කර ගනු ලබයි.

මෙවැනි අවස්ථාවක එම වළල්ලේ තවත් ස්ථානයක බිඳීමක් ඇති වුවහොත් සිදු වන්නේ සන්නිවේදන කටයුතු සඳහා ඇති ඉඩකඩ සීමාවී බොහෝ ප්‍රදේශයන්හි සන්නිවේදන කටයුතු අඩාල වීමයි. මෙම විශාල අවදානම් තත්ත්වය මගහරවා ගැනීමටද නව සංදාමයක අවශ්‍යතාවය බෙහෙවින්ම දැනිණි.

ඒ අනුව රම්බොඩ හා නුවරඑළිය අතර වූ කිලෝමීටර 27ක දුර ප්‍රමාණය සඳහා සංදාමය ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ඇරඹිණි. එහිදී නුවරඑළිය නගරයට ආසන්න ප්‍රදේශයේ සංදාමයට හානියක් සිදුවී නොතිබුණු හෙයින් එම ප්‍රදේශය අත්හැර කටයුතු කළ හැකිව තිබුණි. මෙහිදී භූගත සංදාම වෙනුවට රම්බොඩ සිට නුවරඑළිය දක්වාම ගුවන් සංදාම යෙදීමට තීරණය කරන ලදී.

භූගෝලීය වශයෙන් සහ දේශගුණික වශයෙන් ඇති දුෂ්කරතා මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා ටෙලිකොම් සංදාම නඩත්තු කණ්ඩායමට කිලෝමීටර 27ක දුරක් සහිත සංදාමය ප්‍රතිස්ථාපනය සඳහා ගත වුයේ මාස තුනක් වැනි කෙටි කලකි. එමෙන්ම මහනුවර-නුවරඑළිය අතර සිටින පාරිභෝගිකයන්හට IP සහ BB සේවාවන් ලබාදීමට තිබූ බාධා මෙම ප්‍රතිස්ථාපනය කඩිනම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මගහැරී යනු ඇත.

රම්බොඩ සහ නුවරඑළිය අතර සංදාමය ප්‍රතිස්ථාපනය සඳහා සමාගම විසින් යොදවන ලද මුදල රුපියල් මිලියන 9කි. "ඌව පළාතේ කාර්ය මණ්ඩලයේ සහයෝගය සහිතව සංදාම සංවර්ධන-ප්‍රාදේශීය 2 කණ්ඩායම සහ PCM කාර්යමණ්ඩලය විසින් මෙම ප්‍රතිස්ථාපන කටයුතු සිදු කළා. ඒ නිසා අප සමාගමට 70%ක විතර ඉතිරියක් කිරීමට හැකි වුණා. මෙය කොන්ත්‍රාත්කරුවෙකු ලවා සිදු කළා නම් අපිට මෙයට වඩා පිරිවැයක් දැරීමට සිදු වෙනවා. මේ නිසා විශේෂයෙන් මේ කර්තව්‍යය සාර්ථක කර ගැනීමට දායක වූ අප සමාගමේ සියලු දෙනාටම විශේෂ ස්තූතිය හා ගෞරවය මෙහිදී පිරිනැමිය යුතුයි." යැයි CDR 2 සහ නාගරික කලාප ඉංජිනේරු එච්. එන්. ජී. වික්‍රමරත්න මහතා මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය අගයමින් සඳහන් කළේය.

அவ்வப்போது அதிகரித்து வந்தன" என்று தெரிவித்தார். "இப் பிரச்சினைகள் காரணமாகவே சேதமுற்ற வடங்களை பழுதுபார்த்து அவற்றை ஆரம்ப நிலைக்குக் கொண்டுவர நாம் தீர்மானித்தோம்" என்று அவர் மேலும் கூறினார்.

சாதாரணமாக, தடத்தில் தடை ஏற்பட்டால், அவ்வழிவரும் அழைப்புகள் வேறொருவழிக்கு தானாகவே திசை திருப்பப்பட்டு சேரவேண்டிய இடத்துக்குச் செல்லும். ஆயினும், மாற்று வழியும் சேதமுற்றிருந்தால் அழைப்பு செல்ல முடியாதுபோய்விடும் என்பதுடன், குறிப்பிட்ட பகுதியில் தொலைத்தொடர்புகள் செயலிழந்துவிடும். இந் நிலை ஏற்படாமல் தவிர்க்கும் பொருட்டு இழை ஒளியியல் வடத்தை மீண்டும் ஆரம்ப நிலைக்கு கொண்டுவர வேண்டுமென்ற அவசியத்தை ஸ்ரீலரெலிகொம் உணர்ந்திருந்தது.

றம்பொடை - நுவரெலிய இழை ஒளியியல் வடம் இப்பொழுது மீண்டும் தாபிக்கப்பட்டுள்ளது. அதன் நீளம் 27 கிலே மீற்றர். தரையின் அடியில் அல்லாமல் அது பூரண வான்வழி மூலம் செயற்படும்.

ஸ்ரீலரெலிகொம் இழை ஒளியியல் பராமரிப்புக் குழு சீரற்ற காலநிலை மற்றும் வேறு அசௌகர்யங்களுக்கு மத்தியிலும், மூன்று மாதங்களுக்கிடையில் இச் சாதனையைப் புரிந்துள்ளது. இதன் மூலம், நுவரெலியா, கண்டி ஆகிய பகுதிகளுக்கு முன்னர் கிடைத்திராத IP மற்றும் BB வசதிகள் ஆகிய சேவைகளையும் வழங்க முடிந்துள்ளது.

இக் கருத்திட்டத்தில் 9.0 மில்லியன் ரூபா முதலீடு செய்யப்பட்டுள்ளது. "ஊவா பிராந்திய ஊழியர்களின் உதவியுடன், வடத்தின் அபிவிருத்தி - பிராந்தியத்தின் இரு குழுவினர் மற்றும் PCM அலுவலர்களினதும் பெருமுயற்சியினால் இச்சாதனை நிலைநாட்டப்பட்டுள்ளது. இதற்கென வெளியிலிருந்து ஒப்பந்தக்காரர் ஒருவரின் சேவை பெறப்பட்டிருந்தால், அதிக செலவு ஏற்பட்டிருக்கும்" என்று குறிப்பிட்ட CDR மற்றும் மெற்றோ பிரிவுப் பொறியியலாளர் எச்என்ஜே விக்ரமரட்ன "நாமே இப்பணியை மேற்கொண்டதால், கம்பனிக்கு செலவில் 70% வரை சேமித்துக்கொடுத்துள்ளோம்" என்றும் தெரிவித்ததோடு, இப்பணியில் ஈடுபட்டிருந்த அனைவருக்கும் விசேடமாக தமது நன்றியை தெரிவித்தார்.

## Ramboda - Nuwera Eliya Fibre Optic Cable Restored

The fibre optic ring that covers the main cities such as Colombo, Gampaha, Negombo, Nuwara Eliya, Kalutara, Avissawella and Mount Lavinia, was established in 1998 and is 670 kilometres long. Due to this, SLT has been able to provide its loyal customers with new technology, keeping them in touch with the latest trends in the field of telecommunication.

During the last two years a lot of infrastructure activity such as road development taking place across these areas, meant that parts of the ring were damaged. To keep services going, SLT kept repairing the affected parts by re-connecting the damaged cables using temporary means.

Most of the damage has been caused in the area between Ramboda and Nuwara Eliya. "Parts of the cable were buried directly underground and the rest were carried through aerial cables. When the underground cables were damaged, we temporarily laid a cable via alternate routes, but even this was damaged," said Parinda Weerasekera, Head of Transmission Maintenance section. Weerasekera further explained that because of these damages, the number of faults reported weekly to the Nuwara Eliya Transmission Unit grew at a staggering rate. "It was because of these issues that we decided to repair the damaged cables and bring them back to their original state," he added.

Normally if there is a fault in a cable, calls coming that way will automatically be redirected through another route to reach its destination. However, if the alternate route is damaged as well, the call will not be able to go through and communications in that particular area will cease to operate. To avoid this from



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

happening SLT saw the need to re-establish the fibre optic cable to its original state.

The Ramboda – Nuwara Eliya fibre optic cable has now been re-established and is 27 kilometers long and instead of being underground, the cable is completely aerial.

The SLT Fibre Optic Maintenance Team in no more than three months, despite bad weather conditions and other inconveniences, achieved this feat. Because of the reinstalled fibre optic cable, SLT was able to provide areas of Nuwara Eliya and Kandy with services like IP and BB facilities, which were not available before.

This whole project was a Rs9mn investment. "With the help of the SLT Uva region staff and Cable Development – Region II plus the PCM staff, we were able to achieve this feat. If a contractor from outside was hired for this, the cost would have been much more," said Engineer - CDR & Metro, H N J Wickramarathna of SLT. Wickramarathna also said that "By doing this ourselves, we were able to save about 70% of expense to SLT." He further added a special thank you for everyone who made the reinstallation of the Ramboda – Nuwara Eliya fibre optic cable possible.

## මොබිටෙල් සමාගමට හොඳම පාරිභෝගික උත්පේරක සම්මානය




ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම සාක් කලාපීය හඬ සහ දත්ත සේවා සඳහා 'ශ්‍රී ලංකාවේ හොඳම පාරිභෝගික උත්පේරකයක් ඇති ජංගම දුරකථන ක්‍රියාකරු' සම්මානය දිනා ගැනීමට සමත්විය. සමාගමට මෙම සම්මානය හිමි වුයේ පසුගියදා පැවති පස්වන හඬ හා දත්ත ප්‍රධාන විධායක නිලධාරිවරුන්ගේ සමුළුවේදීය.

මෙම සම්මානයට හිමිකම් කී අනෙක් ජංගම දුරකථන ක්‍රියාකරුවන් වුයේ ඉන්දියාවේ ටාටා ටෙලිසර්විස්, පාකිස්තානයේ වරිඩ් ටෙලිකොම්, බංගලාදේශයේ බංගලාලින්ක්, මාලදිවයිනේ වටානියා සහ නේපාලයේ ස්පයිස් යන සමාගම්ය. භූතානය සඳහා මෙය හිමි නොවීමට හේතු වුයේ එහි එක් ජංගම දුරකථන ක්‍රියාකරුවෙකු පමණක් මෙහෙයුම් කටයුතු සිදු කරන බැවිනි.

## Mobitel Wins Best Consumer Pull Award



Sri Lanka Telecom Mobitel won the Voice and Data SAARC Innovation award for 'Mobile Operator with Best Consumer Pull - Sri Lanka' presented at the fifth Voice and Data CEO Conclave 2006, recently.

The SAARC award winners of 'Mobile Operator with Best Consumer Pull' in their respective countries went out to Tata Teleservices of India, Warid Telecom of Pakistan, Banglalink of Bangladesh, Wataniya of Maldives, and Spice of Nepal. There were no awards to operators in Bhutan as there was only a single operator.

## பாவனையாளர்களை பெரிதும் ஈர்த்த விருதினை மொபிடெல் வென்றது

ஸ்ரீலங்கா ரெலிகொம், மொபிடெல் கம்பனி சார்க் பிராந்திய குரல்வழி மற்றும் தரவுச் சேவைக்கான "இலங்கையின் சிறந்த பாவனையாளர் ஈர்ப்பாற்றல் கொண்ட கையடக்க தொலைபேசி இயக்குநர்" விருதினை வென்றுள்ளது. சமீபத்தில் நடைபெற்ற 5 வது குரல்வழி மற்றும் தரவுச் சேவையின் பிரதான உத்தியோகத்தர்களின் மகாநாட்டில் இக் கம்பனிக்கு மேற்படி பரிசு கிடைத்துள்ளது.

சார்க் பிராந்தியத்தின் ஏனைய நாடுகளான இந்தியா, பாகிஸ்தான், பங்களாதேஷ் மாலைதீவு மற்றும் நேபாளத்திலும் செயற்படும் கம்பனிகளுக்கும் இப்பரிசுகள் கிடைத்துள்ளன. விருதுகளை வெற்றிகொண்ட அந்நாடுகளின் கம்பனிகளாவன:- இந்தியாவின் டாட்டா ரெலி சேர்விசஸ், பாகிஸ்தானின் வாறிட் ரெலிகொம், பங்களாதேஷின் பங்களாலிங்க், மாலைதீவின் வடனியா, நேபாளத்தின் ஸ்பைஸ் என்பனவாகும். பூட்டானில் ஒரே ஒரு கையடக்க தொலைபேசி இயக்குநர் இருப்பதால் அதற்கு விருது வழங்கப்படவில்லை.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# தேசிய தொலைக் கல்வி வலையமைப்புக்கு ஸ்ரீலரெயின் தொடர்புத் தீர்வுகள்

தேசிய தொலைக் கல்வி வலையமைப்புக்கான (NDEN) தொடர்புசார் தீர்வுகளை வழங்குவதற்கென, ஸ்ரீலரெலிகொம் நிறுவன தொலைக் கல்வி நவீனத்துவத் திட்டத்துடன் (NDEN) உடன்படிக்கை ஒன்றைச் செய்துள்ளது.

பட்டதாரிப் பட்டங்கள், முதுமாணிக்கு நிகரான பட்டங்கள், டிப்ளோமா மற்றும் உயர் டிப்ளோமா பட்டங்களை வழங்குமளவுக்கு இலங்கையில் தொலைக் கல்விக் கட்டமைப்பை வலுப்படுத்த தேசிய தொலைக் கல்வி வலையமைப்பு உத்தேசித்துள்ளது. தேசிய தொலைக் கல்வி வலையமைப்பு, தொலைக் கல்விநெறிகளுக்கும் மற்றும் சம்பந்தப்பட்ட திட்டங்களுக்குமென பல்லூடக மையங்களைக் (MMC) கொண்டுள்ளது. இத் தேசிய தொலைக் கல்வி வலையமைப்பு, கல்வி அமைச்சின் தொலைக் கல்வி நவீனத்துவத் திட்டத்தின் கீழ் (DEMP) இயங்குகின்றது. ஆசிய அபிவிருத்தி வங்கி (ADB) நிதி உதவி வழங்கும் இத் திட்டத்தின் நோக்கம் திறந்த மற்றும் தொலைக்கல்வி வசதிகளை அடையத்தகுந்த மற்றும் முடியுமான மட்டங்களுக்கு விரிவடையச் செய்வதாகும்.

நாட்டின் நானா பகுதிகளிலும் தொலக் கல்வி நோக்கங்களுக்கென தேசிய தொலைக் கல்வி வலையமைப்புக்கான பரந்த பகுதி வலையமைப்பு, (WAN) பல்லூடக (MMC) மையங்களை இணைத்துக் கொள்வது ஸ்ரீலரெலிகொம் மெட்றோ ஈதர்நெற் (Metro Ethernet) இன் இழை ஒளியிலலை ஆதாரமாகக் கொண்ட VPLS சேவைகளை அடிப்படையாக்க கொண்டிருக்கும்.

ஸ்ரீலரெலிகொம் நிறுவன பிரதம நிறைவேற்று அதிகாரி திரு. ஜோஷி தக்கஹஷி இவ் வைபவத்தில் கூறியதாவது-

"மனித வள அபிவிருத்தி தனியாட்களுக்கு மாத்திரமல்ல, கம்பனிகளுக்கும் ஏன் நாட்டுக்கும்கூட மிகவும் அவசியமானது. இத்திட்டத்தின் எதிர்கால விளைவுகள் மிகவும் முக்கியத்துவம் வாய்ந்தவை. ஸ்ரீலரெ இத் திட்டத்தில் பங்குகொள்வதையிட்டு பெருமை கொள்கின்றது. இந் நோக்கங்களுக்கென எமது வலையமைப்புத் தீர்வுகளை ஏற்பாடு செய்வதில் மிக்க மகிழ்ச்சியடைகின்றோம்."

தொலைக் கல்வி நவீனத்துவத் திட்டம் (DEMP) இதற்கென நாடளாவிய ரீதியில் கேள்விப் பத்திரங்களைக் கோரியிருந்தது. இதன்படி, ஸ்ரீலங்கா ரெலிகொம் நிறுவன மற்றும் டயலொக் அகன்றபட்டை, லங்காகொம் போன்ற பல சேவை வழங்குநர்கள் கேள்விப்பத்திரங்களைச் சமர்ப்பித்திருந்தன. ஆயினும் ஸ்ரீலரெலிகொம் நிறுவனமே இப் போட்டியில் தெரிவுசெய்யப்பட்டதனால், தொலைக்கல்வி வலையமைப்புக்கான பரந்த பகுதி வலையமைப்பை நிறுவதற்கான பொறுப்பை ஸ்ரீலரெலிகொம் நிறுவனத்துக்கு வழங்கியது.

தொழில்நுட்ப ரீதியிலும் சரி நிதிசார் விடயங்களிலும் சரி உயர்தர போட்டித் தகைமை வாய்ந்ததான மேம்பட்ட தீர்வொன்றைப் பிரேரிப்பதில் எமது கூட்டிணைவுச் சந்தைப்படுத்தல் அபிவிருத்திப் பிரிவு வெற்றிகண்டது.

உடன்படிக்கை கைச்சாத்திடும் வைபவத்தில் ஸ்ரீலரெலிகொம் நிறுவனம் சார்பில் கூட்டிணைவு சந்தைப்படுத்தல் அபிவிருத்திப் பகுதிப் பொறுப்பாளர் திரு. அஜித் சில்வா, தீர்வு வாணிப பகுதிப் பொறுப்பாளர் திரு. ஜனக அபேசிங்க ஆகியோர் பங்குபற்றினர்.

# SLT to Provide Connectivity to NDEN



SLT signed an agreement with the Distance Education Modernization Project (DEMP) for providing connectivity solutions for National Distance Education Network (NDEN).

NDEN is intended to strengthen the distance-learning infrastructure in Sri Lanka to the level of offering Degrees, Masters level degrees, Diplomas and Higher Diplomas. NDEN consists of Multimedia Centers (MMC) for distance learning courses and related programmes. NDEN comes under the Distance Education Modernization Project (DEMP) of the Ministry of Education. The objective of DEMP is to improve open and distance learning facilities to accessible and affordable levels. Asian Development Bank (ADB) is financing the Project

The Wide Area Network (WAN) for NDEN, connecting MMCs for distance learning purposes across the country is based on fiber optic based VPLS services of SLT Metro Ethernet.

Speaking at the ceremony, SLT CEO, Shoji Takahashi said "Human resource development is very important not only for the individuals, but also for companies and the country. The future outcome of this project will be very important and SLT is very happy to participate in this project and we are very happy to provide our network solutions for these purposes."


The DEMP awarded the establishment of WAN for NDEN to SLT following its successful bid in a national competitive tender, with competitive bids from other service providers, including Dialog Broadband and LankaCom. The Corporate Market Development Division was successful in proposing a superior solution, highly competitive in terms of both technically and financially.

From SLT, Ajith Silva, Head of Division,Corporate Market Development and Janaka Abeysinghe Head of Section,Solution Business were present at the occasion of agreement signing.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# දැනුම් සම්පත මධ්‍යම පළාතටත්



ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ආසියානු පදනම හා එක්ව වසර කිහිපයක සිට "දැනුම් සම්පත දසත පතුරවමු" තේමාව යටතේ ක්‍රියාත්මක කරන දීප ව්‍යාප්ත පොත් බෙදාදීමේ වැඩසටහනේ 2006 වසර සඳහා වූ අවසන් පොත් ප්‍රදානය මහනුවර කාර්මික විද්‍යාලයේදී සිදු කෙරිණි. මෙහිදී ඉංජිනේරු, ගෘහ නිර්මාණ සැලසුම්කරණය, මෝටර් කාර්මික, ඉලෙක්ට්‍රොනික් විද්‍යාව සහ ඉංග්‍රීසි භාෂාව යටතේ ලියැවුණු පොත් 600කට ආසන්න ප්‍රමාණයක් ප්‍රදානය කිරීම සිදු විය. මෙම ග්‍රන්ථ මධ්‍යම පළාතේ කාර්මික විද්‍යාල නමයක පුස්තකාලවල පරිහරණය සඳහා යෙදවෙයි. මෙම අවස්ථාවට මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ කළමනාකරු බන්දුල විතාරම සහ මහනුවර කාර්මික විද්‍යාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඇතුළු කාර්යමණ්ඩලයේ රැසක් සහභාගිවූහ.

## 'Spreading the Wealth of Knowledge' to the Central Province


The 'Spreading the Wealth of Knowledge' island wide book distribution programme conducted by SLT in association with the Asia Foundation saw its penultimate book distribution for the year 2006 recently.

The distribution ceremony was held at the Kandy Technical College premises and around 600 books covering the fields of Engineering, Drafting, Auto Mechanics, Electronic Science and the English Language were handed over. The books will be spread across nine Technical College libraries located within the Central Province. Bandula Witharama from the SLT Kandy regional office and Deputy General Manager of the Kandy Technical College participated.

## மத்திய மாகாணம் சென்றடைந்த "அறிவுச் செல்வம்"

ஸ்ரீலரெலிகொம் நிறுவனம், ஆசிய மன்றத்துடன் இணைந்து பல ஆண்டுகளாக "அறிவுச் செல்வத்தை பரப்புவோம்" என்ற கருப் பொருளின் கீழ் நாடெங்கிலும் செயற்படுத்தி வரும் நூல் விநியோகத் திட்டத்தின் 2006க்கான நூல் விநியோகத்துக்கும் இறுதி நிகழ்ச்சி கண்டி தொழில்நுட்பக் கல்லூரியில் நடைபெற்றது. அங்கு பொறியியல்துறை, நிர்மாண வரைபடவியல், மோட்டார் தொழில்நுட்பத்துறை, மின் காந்தவியல் மற்றும் ஆங்கில மொழிப் பாவனை உள்ளடங்களான 600 நூல்கள்வரை வழங்கப்பட்டன. இந் நூல்கள் மத்திய மாகாணத்தில் அமைந்துள்ள 9 தொழில்நுட்ப கல்லூரி நூலகங்களுக்கும் பகிர்ந்தளிக்கப்படும். ஸ்ரீலரெலியின் கண்டி பிராந்திய அலுவலக முகாமையாளர் பந்துல விதாறம மற்றும் கண்டி தொழில்நுட்ப கல்லூரியின் பிரதிப் பொது முகாமையாளரும் கலந்துகொண்டனர்.

# නිහඬ සේවයක් තුළින් ඇගයුමට ලක්වූ Colombo Radio



ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඇතුල් වන සියලුම නෞකා සහ බෝට්ටු නිරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් භාරව කටයුතු කරන ආයතන තුනක් වෙයි. ඒ, ශ්‍රී ලංකා නාවික හමුදාව, ගුවන් සේවා කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමයි. ශ්‍රී ලංකාව තුළ නෞකාවක් වරායට පැමිණෙන තෙක් එම නෞකාව සමග සහ අදාළ රටවල් සමග සම්බන්ධතාවය පවත්වා ගැනීමේ නියෝජිතයා වශයෙන් පත් කර ඇත්තේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමයි. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ Colombo Radio අංශයෙන් මෙම කටයුතු නිරීක්ෂණය කිරීම සිදු වෙයි. මෙහෙයුම් නිලධාරීවරයෙක් සහ ඉංජිනේරුවරයෙක් මේ සඳහා සේවයට අනුයුක්ත කර ඇත.

ඒ අනුව ලංකා මුහුදු සීමාවට ඇතුල් වන ඕනෑම යාත්‍රාවක් සමග ෆැක්ස් ටෙලෙක්ස් මාර්ගයෙන් සබඳතාවය පවත්වා ගනිමින් නෞකාවේ නම, රට, නෞකාවේ දිග පළල, නෞකාව තුළ සේවය කරන සේවක සංඛ්‍යාව සහ ප්‍රවාහනය කරන ද්‍රව්‍ය හෝ භාණ්ඩ පිළිබඳ තොරතුරු ලබාගැනීම මෙහිදී සිදු කරයි. මෙරට මුහුදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සීමාව තුළ යම් නෞකාවකට හෝ යාත්‍රාවකට යම් හානියක් සිදු වුවහොත් ඊට කඩිනම් පියවර ගැනීම සඳහා අදාළ පාර්ශ්ව වෙත සන්නිවේදනය කිරීමට මෙම කරුණු ලබාගැනීම වැදගත් වෙයි. මේ තොරතුරු අවශ්‍ය වෙතොත් නාවික හමුදාවට හෝ ගුවන් සේවා කටයුතු අමාත්‍යාංශයට ලබාදීම සිදු කරයි.

පසුගියදා ගාල්ල මුහුදු සීමාවේදී පෙරළී ගිය දැව කඳන් පටවා ගත් නෞකාවෙන් ඇති වූ තෙල් කාන්දුව නිසා ගාල්ල මුහුදු කලාපයට සිදු වූ පාරිසරික විනාශය අති විශාල විය. එසේම ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණවලින් හෙළි වුයේ අදාළ නෞකාව විසින් මුහුදු සීමා නීති උල්ලංඝනය කරමින් කටයුතු කළ බවයි. තවද මෙරට මුහුදු සීමාවට ඇතුල් වූ අවස්ථාවේ පටන් Colombo Radio අංශය විසින් එම නෞකාව සමඟ සම්බන්ධ වීමට උත්සාහ කළද නෞකාවෙන් ඒ සඳහා පිළිතුරු නොලැබුණු බවද හෙළි විය. මේ නිසා අදාළ නෞකාව අයත් සමාගමට විරුද්ධව නඩු පැවරීමට නීති අධිකාරීන්ට හැකි වූ අතර ඒ සඳහා ප්‍රබල සාක්ෂියක් බවට පත් වූයේ Colombo Radio අංශය විසින් එම නෞකාව සමඟ සන්නිවේදනය සිදු කිරීමට අදාළව ඉදිරිපත් කළ තොරතුරු පත්‍රිකාවයි.

සිය සේවය නිගඬව එමෙන්ම වඩාත් අවධානයෙන් හා වගකීමෙන් යුතුව ඉටු කිරීම නිසා Colombo Radio අංශය විසින් මෙසේ සමාගමටත් රටටත් අත් කර දුන් කීර්තිය වටිනාකම මුදලින් මැනිය නොහැක. එවන් අනගි සේවයක් ඉටු කිරීම වෙනුවෙන් Colombo Radio අංශයේ කාර්ය මණ්ඩලයට ඇමතුම සිය කෘතවේදීත්වය පුද කරයි.

## Invaluable Service of Colombo Radio

The Sri Lanka Naval Force, the Ports and Aviation ministry, and SLT have the authority to observe all ships and boats that enters the territorial waters of Sri Lanka.

SLT has been given the sole responsibility of coordinating communication between ships that enter any of the ports of Sri Lanka and the relevant country the ship originates from. The company's Colombo Radio service oversees the responsibility, with the help of its engineers and officers.

In this regard, any ship that enters the territorial waters of Sri Lanka will have to submit information with regards to the ship's name, what country it comes from, its height and width, the number of officers, and the goods that it transports through the fax telex service.

This service will be of great service, especially when a ship is damaged in the seas of Sri Lanka. When such information is needed, the Navy and the ministry will be able to receive it and immediately decide what steps should be taken.

Colombo Radio played a significant role in the recent investigation on the environmental pollution caused by a ship, damaged when transporting oil off the seas of Galle. After the investigation was concluded, a case was filed as the management of the ship failed to respond to the warning by Colombo Radio that it was entering the territorial waters of Sri Lanka illegally. Colombo Radio provides an invaluable service to the country, which cannot be measured in terms of monetary value.

## Test Wire එකක් සේවකයෙකුගේ දැතින්




දුරකථන ජාලයේ දෙපස සාමාන්‍යයෙන් හුවමාරු මධ්‍යස්ථානයක බෙදුම් මැදිරිය සවි කරන විට සාමාන්‍යයෙන් සැපයුම්කරු විසින් දුරකථන පද්ධතියේ දෝෂ පරීක්ෂා කිරීම සඳහා නඩත්තු උපකරණ ලබාදෙන අතර ඒවා හානිවීමකට ලක්වුවහොත් නැවත අලුත්වැඩියා කිරීම හෝ අලුතින් සැපයීම අදාළ සමාගම විසින් සිදු කරයි.

තාක්ෂණය දියුණුවීමත් සමඟ නවීන පන්නයේ විනිමය ඒකක අප සමාගම විසින් මිලදී ගත් අතර නව තාක්ෂණික ක්‍රමවේදයන් අදාළ කර ගැනීමටද අප සමාගමට හැකි විය. මෙම නව හුවමාරු මධ්‍යස්ථාන භූගත සංදාම සමඟ සම්බන්ධ වූයේ ප්‍රධාන කාර්යාලයේ ඇති ප්‍රධාන බෙදුම් මැදිරිය හරහාය.

නාගරික කලාපය තුළ දුරකථන 45,000කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කෙරෙන ප්‍රධාන කාර්යාලයේ ඇති ප්‍රධාන බෙදුම් මැදිරියෙහි MPC tag blocks වලට සම්බන්ධ කර ඇති දුරකථනවල දෝෂ පරීක්ෂා කිරීමට යොදාගත් Test wire උපාංගය පසුගිය දිනක ක්‍රියා විරහිත විය. සැපයීම් අංශය මගින්

## Test Wire Produced by SLT Employee



The test wire is a key component when repairing a fault within the telecommunication network. Recently, the test wire tool, which has been in use for the past ten years, had to be replaced.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේවා අලුතින් ලබා ගැනීමට මිල ගණන් කැඳවීම් කළද ඒ සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවූ බව දැන්විය.
අබලන් වූ Test Wire එකෙන් ඉතා අපහසුවෙන් දුරකථන පරීක්ෂා කිරීම් කරගෙන යන අතර එම MDF Test Wire උපාංගය තැනීමට අප සමාගමේ පී. එවරස්ටස් ප්‍රනාන්දු මහතා සමත් විය. විනිමය හුවමාරු මධ්‍යස්ථානයෙන්ම සොයාගන්නා ලද ඉවත දමන ද්‍රව්‍ය ආශ්‍රය කර ගනිමින් නිපදවන ලද මෙම MDF Test Wire උපාංගය පෙරදී සැපයුම්කරුවන් විසින් සැපයූ ඒවා හා සමාන ක්‍රියාකාරීත්වයෙන් යුතු වෙයි. සිය හැකියාවන් තුළින් සමාගමට මෙවන් ආදර්ශයක් ලබාදීමට ක්‍රියා කළ පී. එවරස්ටස් ප්‍රනාන්දු මහතාට සිය හැකියාවන් තව තවත් දියුණු කරගෙන සමාගමටත් රටටත් සේවය කිරීමට ධෛර්යය ලැබේවා!යි ඇමතුම ප්‍රාර්ථනා කර සිටියි.

Due to unavailability of the tool in the open market, SLT faced a dilemma because it has a network of 45,000 telephone lines in the metro area, whose repairs, if any, depend on the test wire.

In this regard, P Everestus Fernando came forward to successfully create a similar test wire using discarded tools he found from the Central Exchnage. SLT appreciates his enterprising effort in doing so as well as his commitment to ensuring that the company meets any challenge it faces.

## අවමංගල්‍යාධාර දීමනාව වැඩි කෙරේ

ශ්‍රී ලංකා ටෙලිකොම් මූලස්ථානයේ 7 වන මහලේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2006.11.07 දින පැවති මානව සම්පත් ජංගම සේවා වැඩසටහනේදී ප්‍රධාන විධායක නිලධාරීතුමා විසින් ගැටලු හා යෝජනා ඉදිරිපත් කිරීමට සේවකයින්හට අවස්ථාවක් ලබාදෙන ලදී. එම අවස්ථාවේ සුබ සාධක නිලධාරිනී පැට්‍රිෂියා ගුණසේකර මහත්මිය විසින් දැනට සේවකයෙකුගේ අභාවයකදී ආයතනය විසින් පිරිනමනු ලබන අවමංගල්‍යාධාර දීමනාව වන රුපියල් 25,000/=ක මුදල ප්‍රමාණවත් නොවන බැවින් එය වැඩිකර දෙන මෙන් යෝජනා කර ඇත. එම යෝජනාව පිළිගනිමින් නොවැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනාව රු.75,000/= දක්වා වැඩි කිරීමට ප්‍රධාන විධායක නිලධාරීතුමා සිය අනුමැතිය ලබා දී ඇත.

## மரணாதார கொடுப்பனவு அதிகரிப்பு

ஸ்ரீலங்கா டெலிகொம் நிறுவனத் தலைமை அலுவலகத்தின் 7வது மாடியில் ஊழியர்களுக்கென 2006.11.07 இல் நடைபெற்ற மனிதவள நடமாடும் சேவை நிகழ்ச்சியின்போது பிரச்சினைகளையும் ஆலோசனைகளையும் சமர்ப்பிப்பதற்கு பிரதம நிறைவேற்று அதிகாரி ஊழியர்களுக்கு சந்தர்ப்பம் வழங்கினார். ஊழியர் ஒருவருக்கு மரணம் சம்பவிக்குமிடத்து மரணாதார கொடுப்பனவாக தற்பொழுது ரூ. 25,000/= வழங்கப்படுவதாகவும், அக் கொடுப்பனவு குறைவாகக் காணப்படுவதால், அதை அதிகரித்து வழங்குமாறு சேவை நலன் உத்தியோகத்தர் பட்றிஷியா குணசேகரா ஆலோசனை கூறினார். அவ்வாலோசனையை ஏற்றுக்கொண்ட பிரதம நிறைவேற்று அதிகாரி நவம்பர் முதலாந்திகதி தொடக்கம் அக் கொடுப்பனவை ரூ 75,000 ஆக அதிகரிப்பதற்கு அனுமதி வழங்கினார்.

## Increase in Funeral Funds

A Human Resource programme for the staff of the Mobile Service section was held at the SLT head office on November 7, 2006, where the participants had the opportunity to present their views and requests to the CEO.

A proposal forwarded by Patricia Gunesekara, Welfare Officer to increase the current funeral allowance from Rs25,000 was taken into account.

The CEO approved the increase in the money paid when a staff member passes away to Rs75,000. This came into effect from the beginning of November 1, 2006.

## The Slammer

By Sudarsha Jayawardene – Eng.Information Security

Malicious computer programmes (computer viruses) come in a wide verity of forms and is distributed or spread through an ever-growing number of mechanisms. In general, malicious code is any software that hinder the normal operation of a computer or networking device. This software most often execute without the user's consent. 'Worm' viruses are a type of virus that spreads basically through e-mails, and the interesting part is that they replicate or make copies of themselves and spread to other computers causing harmful effects. Generally the creators of these types of viruses take advantage of a specific weakness in popular operating systems. Following is a real incident that happened in year 2003. The virus was named as 'Slammer.'

Many computer security experts called 2003 the year of the 'worm' because for 12 months, worms spread across the internet with the intensity of an apocalyptic event. It began in January, when the 'Slammer worm' infected nearly 75,000 servers in 10 minutes and doubling in size every 8.5 seconds. It was widely reported that slammer clogged one of America's leading bank's ATM network and caused impact on business and the company image.

On January 25, 2003, Slammer worm caused a slowdown of internet speed world wide, and caused considerable harm through network outages. It was also suspected that this worm virus was responsible for crippling of a 911 emergency call centre as well as numerous canceled airline flights. In addition it was reported that Slammer also infected a Nuclear power plant's network, resulting in the inability

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of computers to communicate with each other, leading to a total breakdown of the system, which was avoided by officials with great effort.

Analysis showed that the damage caused could have been reduced if the systems were patched properly, if information regarding this virus was taken seriously and if preventive action was taken on time. Every day, as computer users we are vulnerable to hundreds of different types of attacks. If we follow good practices in PC, e-mail, internet usage we can protect ourselves from these types of viruses.

## තුඹ මල් යාය සමාජ සත්කාරය කරුක්කන්කුලම විජයබා විද්‍යාලයට





ප්‍රධාන ජාල පද්ධති නිලධාරි ක්‍රිස්ටි අල්විස් මහතාගේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ජාල පද්ධති සහෘද සංසදය විසින් වාර්ෂිකව සිදු කරන විශේෂ සමාජ සත්කාර වැඩසටහනට මෙවර තෝරා ගැනුණේ කරුක්කන්කුලම විජයබා විද්‍යාලයයි. අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි අඩුපහසුකම් සහිත දුෂ්කර පාසලක් වන විජයබා විද්‍යාලය මෙම වැඩසටහන සඳහා තෝරා ගැනීම සිදු වූයේ අනුරාධපුර ටෙලිකොම් කාර්යාලයේ කළමනාකරු රසිත අබේකෝන් මහතාගේ සහ අනුරාධපුර කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ අබේරත්න මහතාගේ මගපෙන්වීම යටතේය.
විද්‍යාලයේ ඉගෙනුම ලබන දරු දැරියන්ට අවශ්‍ය පොත්පත් සහ පාසල් උපකරණ ලබාදීමට අමතරව පාසලට එතෙක් අඩුපාඩුවක්ව පැවති ජල නල පද්ධතියක් ඉදි කිරීම සඳහාද ටෙලිකොම් ජාල පද්ධති සහෘද සංසදය කටයුතු කරන ලදී.



Prabuddhi Vihanga Wellala Hettige, daughter of Nimal Gajadeera and Indika Nalindrasinghe Wellala Hettige attached to the Teleshop Bandarawela celebrated her fourth birthday on October 6, 2006.





Anushika Subramaniyam, daughter of Vimala Subramaniyam attached to SLT, Kalmunai branch celebrated her third birthday on October 13, 2006.




Dulnith Wanniarachchi, son of P Wanniarchchi attached to the Maintenance section, Galle and Swarna Mutukumara celebrated his second birthday on April 16, 2006.





Nevindu Sithsiri Dissanayake, son of D M S Dissanayake and C H D Shanthi Kularatne celebrated his second birthday

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# Retirements


W Gunarathne attached to the ER and Welfare division retired **after 40 years of service**


H D J Perera attached to Transport retired **after 40 years of service**


J A Yasawathie attached to the Call Centre (Operation) retired **after 26 years of service**


I S Goonawardana attached to the CEO's Office retired **after 39 years of service**


J Gunasena attached to the Call Centre (Operation) retired **after 38 years of service**


R H Liyanage attached to RTOM – Galle retired **after 41 years of service**


G D M Violet attached to RTOM Avissawella retired **after 24 years of service**


W S Fernando attached to OPMC Avissawella retired **after 29 years of service**


R M D B Wimalakeerthi attached to the Call Centre (Development) and TCS retired **after 29 years of service**

Amathuma wishes all of the above a happy and fruitful retirement!

# Wedding Bells


Deneesha Perera attached to the Sales Division wed K R D Jayans Milroy recently. Amathuma wishes the couple a happy wedded life.

# Resignations


S G K de Silva attached to Project 2 **resigned on 01/08/2006**


M A A N Fernando attached to OPMC Narahenpita **resigned on 16/09/2006**


K S Vijayalayan attached to the IP and BB Section **resigned on 02/08/2006**


S Sivasothy attached to the IP and BB Network **resigned on 04/08/2006**

# Obituaries


R Premachandra attached to Technical (Higher Grade) **passed away on 23/09/2006**

SLT would like to extend its deepest condolences to the family.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

BREAKTHROUGH THINKING

## පළමු Movers පුහුණු වැඩසටහන සාර්ථකයි!

පසුගිය නොවැම්බර් 15 සහ 16 යන දෙදින තුළ තුල්හිරිය කාබුල් ලංකාහිදී පළමු අභිබවන චින්තන Movers පුහුණු වැඩසටහන පවත්වන ලදී. මේ සඳහා අප සමාගමේ 46 දෙනෙකුට ආසන්න පිරිසක් සහභාගී වූ අතර ඔවුහු ඇමතුම් මධ්‍යස්ථාන, මොරටුව ඇඟැසි විදුහල, වැලිසර ඇඟැසි විදුහල, තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රවාහන යන අංශ නියෝජනය කළහ. මේ සඳහා සම්පත් දායකත්වය ලබාදෙන ලද්දේ අභිබවන චින්තන කමිටුවේ සාමාජිකයන් විසිනි. අභිබවන චින්තන සංකල්පය පිළිබඳව දියත් කෙරුණු පුහුණු වැඩසටහන්හි දෙවන අදියර වන්නේ Movers පුහුණු වැඩසටහනයි. මෙහිදී අභිබවන චින්තනයේ පළමු මූලධර්ම තුන පිළිබඳව හඳුන්වාදීමක් සිදු කෙරෙන අතර එය දෙදින නේවාසික වැඩසටහනකි. එහි පළමු අදියර වශයෙන් ක්‍රියාත්මක වූ Beginners පුහුණු වැඩසහන මගින් සමාගමේ සමස්ත කාර්ය මණ්ඩලයෙන් 65%ක් ආවරණය කෙරිණි. පැය තුනක කාලයක් පුරා පැවත්වූ මෙම Beginners පුහුණු වැඩසටහන මගින් අභිබවන චින්තනය හා එහි යාන්ත්‍රණය පිළිබඳව මූලික හැඳින්වීමක් ලබාදෙන ලදී.

## முதல் Movers பயிற்சித் திட்டம் வெற்றி

சென்ற நவம்பர் 15,16 ஆம் திகதிகளில் துல்கிரிய காபுல் லங்காவில் முதலாவது தடைமீறு சிந்தனை Movers பயிற்சி நிகழ்ச்சித் திட்டம் நடைபெற்றது. இதில் எமது கம்பனியைச் சேர்ந்த சுமார் 46 போர் கலந்துகொண்டனர்.

இதற்கான ஏற்பாடுகளை தடைமீறு சிந்தனைக் குழுவின் உறுப்பினர்கள் செய்திருந்தனர். தடைமீறு சிந்தனைக் கோட்பாடு பற்றி தொடர்ந்து நடைபெற்று வரும் பயிற்சி நிகழ்ச்சித் திட்டத்தின் மூன்றாவது கட்டமே Movers பயிற்சி நிகழ்ச்சித் திட்டமாகும். இதில் தடைமீறு சிந்தனைக் கோட்பாடுகள் மூன்றினை அடையாளம் கண்டுள்ளதுடன், அது இருநாள் பயிற்சியாகவும் அமைந்தது. இதன் முதலாவது கட்டமாக நடைபெற்ற தொடக்க நிலை ஊழியர்களுக்கான பயிற்சி நிகழ்ச்சித் திட்டத்தின் மூலம் கம்பனியின் ஊழியர்கள் 65% சதவீதமானோர் பயிற்சி பெற்றனர். மூன்று மணிநேரம் நடைபெற்ற இந்த பயிற்சி நிகழ்ச்சித்திட்டத்தின் மூலம் தடைமீறு சிந்தனை மற்றும் அதன் முக்கியத்துவம் பற்றிய அடிப்படை அறிவு எடுத்துக் கூறப்பட்டது.



## නිවැරදි කිරීමයි!

"අභිබවන චින්තන තේමා ගීය එළි දකී" හිසින් පසුගිය කලාපයේ පළ වූ ප්‍රවෘත්තියේ පහත සඳහන් අයගේ නම් වැරදියට පළ වූ අතර එය මෙසේ නිවැරදි විය යුතුය.

සුසිල් ගෝමිස්
රමණී වික්‍රමාදර

## திருத்தம்

சென்ற இதழில் "தடைமீறு சிந்தனை குறியிசைப் பாடல்" என்ற தலைப்பில் வெளியிட்ட செய்தியில் இருவரின் பெயர்கள் தவறாகப் பிரசுரிக்கப்பட்டிருந்தன. அப்பெயர்கள் பின்வருமாறு திருத்தஞ் செய்யப்பட வேண்டும்.

- சுசில் கோமிஸ்
- ரமணி விக்கிரமாதற

## 2006 රාජ්‍ය නාට්‍ය උලෙළේ හොඳම රංගාලෝකට ජේ.කේ. සුනිල් ශාන්තට



පසුගියදා අවසන් වූ 2006 රාජ්‍ය නාට්‍ය සම්මාන ප්‍රදානයේදී හොඳම රංගාලෝකය වෙනුවෙන් සම්මානය දිනාගැනීමට ජේ. කේ. සුනිල් ශාන්ත මහතා සමත්විය. ඒ මහතා අප සමාගමේ රත්නපුර ප්‍රාදේශීය විදුලි සංදේශ කාර්යාලයේ සේවය කරයි.

'සද්ධන්ත' වේදිකා නාට්‍යයේ රංගාලෝකය වෙනුවෙන් මෙසේ සම්මානයෙන් පුදලද සුනිල් මහතා වසර 20කට ආසන්න කාලයක් තිස්සේ කලා කටයුතුවල නිරත වෙයි. 'කඳා වළලු', 'සිහින හතක්', 'අභිම් ආදා', 'ප්‍රාර්ථනා' ආදී නිර්මාණයන් සඳහා සුනිල් සිය දායකත්වය ලබාදී ඇත. සිය කලා දිවිය තුළ මෙවන් සාර්ථකත්වයක් අත්පත් කරගැනීමට මග පාදා දුන් සද්ධන්ත නාට්‍යයේ නිෂ්පාදක සුමිත් අමරකෝන් සහ එහි සංගීත අධ්‍යක්ෂ සමන් තිලක බඹරැන්ද යන මහත්වරුන්ටත් පිලියන්දල උපාලි ඒ. වීරසිංහ මහතාටත් සුනිල් සිය කෘතවේදීත්වය පිළිගන්වයි. සුනිල්ගේ කලා දිවියේ ඉදිරි අනාගතයට ඇමතුමින් සුබාසිරි!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org



# මිහිලිය හැර යන අඳුන් දිවියා

බිළාල ගෝත්‍රයේ තවත් අපූරු සාමාජිකයෙක් වන අඳුන් දිවියා පෙනුමෙන් බළලෙකුට බොහෝ සමානයි. සත්ත්ව ලෝකයේ ඇනිමාලියා (Animalia) රාජධානියට අයත් වන අඳුන් දිවියා ෆෙලිඩේ (Felidae) පවුලේ සාමාජිකයෙක්. විද්‍යාත්මකව පැරියෝනේලුරස් විවෙරිනස් (Prionailurus viverrinus) නමින් හැඳින්වෙයි. මාළු බෑමට ප්‍රිය කරන නිසාම අඳුන් දිවියා ඉංග්‍රීසි භාෂාවෙන් ෆිෂිං කැට් (Fishing Cat) ලෙසින් හැඳින්වෙනවා. නිරිතදිග ඉන්දියාව, හිමාලය, ශ්‍රී ලංකාව, බංගලාදේශය, වියට්නාමය, තායිලන්තය, බුරුමය, චීනය, ජාවා සහ සුමාත්‍රා දූපත්වල සිය ව්‍යාප්තිය දක්වන අඳුන් දිවියා තෙත් බිම් ආශ්‍රිතව විශේෂයෙන් ජලාශ්‍රිත ප්‍රදේශවල ජීවත් වෙයි. කෙටි එහෙත් ශක්තිමත් පාද, තරමක් පුළුල් මුහුණක් සහ කෙටි වලිගයකට හිමිකම් කියන අඳුන් දිවියා, සාමාන්‍යයෙන් රාත්තල් 13-26ත් අතර බරකින් යුක්තයි. දිගු සිරුරකට උරුමකම් කියන මොවුන්ගේ සිරුර සාමාන්‍යයෙන් අඟල් 25-34ක් පමණ දිගු වෙනවා. අඳුරු කොළ පැහැයෙන් යුතු සිරුරේ තැනින් තැන කළු පැහැ පුල්ලි විහිදුණු ආකාරයක් දැකිය හැකියි. පිටකොන්ද ආශ්‍රිතව සමේ පුල්ලි වෙනුවට කළු පැහැ ඉරි දැකිය හැකියි. මාළු ඇල්ලීම සඳහා ජලයේ පිහිනා යාම පහසු කරන අඳුන් දිවියාගේ කෙටි, පැතලි වලිගය ඌට ඒ සඳහාම ලද දායාදයක්.

අඳුන් දිවියාගේ ප්‍රියතම ආහාරය වන්නේ මත්ස්‍යයින්. ඊට අමතරව කුරුල්ලන්, ගොළුබෙල්ලන්, නයි, ගෙම්බන් ආදී සතුන්ද වෙනවා. මීට අමතරව අවස්ථාවක් ලද හොත් ගැහැස්ව ඇති කරන එළුවන්, බල්ලන්, වසු පැටවුන් මෙන්ම කුකුළන් ආදී සතුන්ගේ මස්වල රසය විඳීමටත් අඳුන් දිවියන් කැමතියි.

දින 63ක ගැබ් කාලයකින් පසු අඳුන් දිවියාගේ ගැහැණු සත්ත්වයා පැටවුන් 1-4ක් අතර ප්‍රමාණයක් බිහි කරයි. උපතේදී මේ පැටවුන්ගේ බර අවුන්ස 3.5-6ත් අතර වෙයි. ඉන්පසු ගෙවෙන සෑම දිනකම බර ග්‍රෑම් 11කින් වැඩි වෙයි. ඉපදී ගෙවෙන 16වන දිනයේදී සිය දෙනෙත හරින පැටවුන් ආහාර ගැනීම ආරම්භ කරන්නේ දින 53ක් පිරුණු තැනයි. සාමාන්‍යයෙන් පැටවුන්ගේ සිරුර මාස 8-9ක් ගත වන විට වැඩුණු අඳුන් දිවියෙකුගේ ශරීර ප්‍රමාණයට සමාන වෙයි. මාස 10ක් පිරුණු පසු ඔවුන්ට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ සැලසෙයි.

කෙසේ වුවත අදවන විට අඳුන් දිවියා සිටින්නේ මිහිතලයෙන් වඳවී යන සතුන්ගේ ලැයිස්තුවේ ඉහළින්මයි. තෙත් බිම් එළි පෙහෙළි වී ජනාවාස ඉදිවීම, කාර්මීකරණය නිසා ගංගා හා ජලාශ්‍රවල විෂ ජලය මුසු වීම හේතුවෙන් ඔවුන්ගේ ප්‍රධාන ආහාරය වන මාළුන් වඳ වීම යන කරුණු නිසා අද ලෝකයේ අඳුන් දිවියන් ඉතිරිව ඇත්තේ අල්පයක් තරම් වූ ප්‍රමාණයකි.

# පන්හිඳ

## නව වසරට ගෙනෙන පැතුම්

සොබා දහමට කුරිරු නොමවන්නට
දිවි ඇති තාක් මෙත වඩවන්නට
පුරුදු වී පුබුදු වී සිටින්නට
දුකක් නොමවන්න
සැපතක්ම සිදුවන්න සිතේවා! සිතේවා!
අත් පා නොමැති අයටත්
ඇස් කන් නොමැති අයටත්
මිල මුදල් නැති උන්වත්
කුසගිනි නොවන්නට
ලෙඩ දුක නොවන්නට
සැපතක්ම සිදුවන්නට සිතේවා! සිතේවා!
අව් වැසි ගෙනෙයි පීඩා
සිත කරයි මංමුලා
අනුන් නසාලන නපුරු සිතුවිලි
නොඑන් මසිතට කිසිදා
ඔබ සිතටත් ගන්න එම ලෙසින්
තුන් සරණින් අපේ රටට
රටේ වෙසෙන සියළු අයට
කරදර දුක් නොම ලංවී
සතුට සැපත ඉටුවේවා!

**මහනුවර ඇමතුම් මධ්‍යස්ථාන නිළධාරිනි**
**ඉන්ද්‍රානි තිලකරත්න ගෙනි**

## නත්තල

උතුරෙන් දකුණෙන් ගිනි ඇවිළී
අවි ගැටෙනා යුගයේ
තවත් නත්තලක් උදා වෙලා
සාමයෙ අගය කියා

පවට නැමී බැහැරව ගුණ දම්
දුසිරිත වැඩූ යුගයේ
තවත් නත්තලක් උදා වෙලා
සුසිරිතෙ අගය කියා

පුහු අගයන් හිස් කිරුළු දරා
සරු ධම් මැකි යුගයේ
තවත් නත්තලක් උදා වෙලා
මනු බව අගය කියා

වඩින්න සාම කුමරුවනේ
වඩින්න ජේසු බිළිඳුනේ
මකන්න දුසිරිත් ලෝ තලේ
පා ඔබේ දයා සුපෙම්

**සුසිල් ගෝමිස්**
**මිළදී ගැනීම් අංශය**

## කියූ රහසක් හමුවුණා මට- දිනපොතක ලියවී ඇති

දිවිය මුල සිට කවිය අවියක් විලස රඳවා මගේ හිතේ
ඔබය මට කවි "අ" යනු "ආ" යනු කියා දුන්නේ පොත පතේ
සවිය තිබුණත් කවි ලොවේ ඉහළට නගින්නට හිණි පෙතේ
මමය පොඩි පුතු තවම ඔබගේ ඇවිද යන පා පියුමතේ

මියු කවි පෙර නොදරුවෙකු ලෙස තවම මට අමතක නැතී
සියුම් දෑ කවියකට නැගුමට හැකිය අද මට ඒ ඇතී
පියුම් පිපෙනා බව දැනී මගෙ කවි විලේ මතු සුවදැතී
කියූ රහසක් හමු වුණා මට දින පොතක ලියවී ඇතී

මිහිරි පදවැල් සිහින් දියසැරි ලෙස ගලා යන විට ඔහේ
පැතිරිලා යන නැවුම් සතුටක් දැනේ පිනි ලෙස ඉල් මහේ
කෙඳිරි ගාමින් නොසිට නොලැබූ ජයක් වෙනුවෙන් ඇති කොහේ
සුපිරි දිවියක් උරුම නොවුනත් පිපී ඇත කවි මල් ඉහේ

සොයා දිවි මග පහන් කළ හැකි කවිකමත් මට දී ඔබේ
දයාබර මිනිසත්කමත් මගෙ ඉහළටම ඔසවා තිබේ
තියාගෙන හිස කෙලින් හිඳිනට අවැසි ශක්තිය මැද සබේ
පියාණෙනි! මට ලැබුණේ ඒ හැම කුඩා ලේ බිඳකිනි ඔබේ

**විජේරත්න කොඩිප්පිලි**
**ශ්‍රී ලංකා ටෙලිකොම්**
**රත්නපුර**



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org